# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2293/73 - 2022 අගෝස්තු මස 20 වැනි සෙනසුරාදා - 2022.08.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක - IR/COM/01/2017/256

**කාර්මික ආරවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.08.05 දිනැති හා අංක 2135/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.07.24 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් මන්නාරම, එළුතුර්, සෙල්වනගර්, අංක 45 හි පිහිටි ටී. තුෂ්‍යන්තන් මයා සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.07.07 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 අගෝස්තු මස 08 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ කාර්මික අධිකරණයේ දීය.

තයාලන් තුෂ්යන්තන්,
අංක 45, සෙල්වනගර්,
එලුතුර්,
මන්නාරම.

*පළමු පාර්ශවය*

නඩු අංකය : A71/2019
ගොනු අංකය : IR/COM/01/2017/256

*එදිරිව*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කිරුළපන පාර,
කොළඹ 05.

*දෙවන පාර්ශවය*

වර්ෂ 2022 ක් වූ ජූලි මස 07 වන දින දී ය.

**බලතල පැවරීම**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතා වෙත 1957 අංක 14, 1957 අංක 62, 1962 අංක 04 හා 1968 අංක 39 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත් වලින් සංශෝධිත ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වන පරිච්ඡේදය වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් ආරවුල බේරුම් කිරීම සඳහා මාවෙත පවරා තිබේ.

**උද්ගතව පවත්නා කාර්මික ආරවුලේ ස්වභාවය**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අනුයුක්තව මන්නාරම ඩිපෝවේ සේවය කළ තයාලන් තුෂ්යන්තන් මහතා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් හඳුන්වාදෙන ලද ස්වෙච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමය යටතේ කැමැත්තෙන් විශ්‍රාම යාම සඳහා ඉල්ලුම් කළද ඊට අදාළ මුදල් ගෙවීම ප්‍රමාද වීම හේතු කරගෙන ඉන් ඉවත්ව නැවත රැකියාව ඉල්ලා සිටිය ද එය ලබා නොදීමෙන් ඔහුට අසාධාරණයක් සිදුවී තිබේද යන්න වේ.

**කාර්යභාරය**

ඉහත පරිදි පළමු පාර්ශවයට අසාධාරණයක් සිදුවී තිබේද යන්න පරික්ෂා කර බලා එසේ වී නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව ප්‍රදානයක් ලබාදීම මාගේ කාර්යභාරය වී තිබේ.

**පාර්ශවයන්ගේ කරුණු දැක්වීම**

මෙහි ඉහත දැක්වෙන කාර්මික ආරවුල සම්බන්ධයෙන් නඩුව විභාගයට ගැනීමට පෙරාතුවම 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ අංක 39 දරන වගන්තිය යටතේ 1959 මාර්තු මස 02 දිනැති හා අංක 11688 දරන රජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 1969 කාර්මික ආරවුල් පනත යටතේ වූ නියෝග සංග්‍රහයේ 21 (1) දරන නියෝගය පරිදි මෙකී ආරවුලට හේතු වූ කරුණු කාරණා සම්බන්ධයෙන් පාර්ශවයන් වෙතින් ප්‍රකාශයක් ඉල්ලා සිටි අතර එහිදී පළමු පර්ශවය මෙන්ම දෙවන පාර්ශවය ද ලිඛිතව කරුණු ඉදිරිපත් කර තිබිණ. එම කරුණු දැක්වීම තුළින් පාර්ශවයන් ඉදිරිපත් කරන ලද කරුණු පහත පරිදි සාරාංශ කර දැක්විය හැකිය.

**පළමු පාර්ශවයේ කරුණු දැක්වීම**

- තමා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ලිපිකරුවෙකු වශයෙන් වර්ෂ 2003 සැප්තැම්බර් මස 12 වැනි දින සිට සේවයට බඳවාගත් බව.
- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මන්නාරම ඩිපෝවේ VIII B ශ්‍රේණියේ ලිපිකරුවෙකු වශයෙන් සේවය කරද්දී මණ්ඩලය විසින් හඳුන්වාදුන් කැමැත්තෙන් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමය මත වසර 13 ක සේවය සපුරා සිටිමින් ඒ සඳහා අයදුම් පතක් ඉදිරිපත් කරන ලද බවද,
- තම පියාගේ හෘද සැත්කම සඳහා අවශ්‍ය මුදල සපයා ගැනීමේ පරමාර්ථය මුල්කර ගනිමින් මෙම යෝජනා ක්‍රමයට අනුව ඉහත සඳහන් අයදුම්පත ඉදිරිපත් කිරීම කළ බවද,
- එහෙත් තමාට තව වසර 23 ක පමණ කාලයක් සේවය කිරීමට මානසික හා ශාරීරික යෝග්‍යතාවය තිබුණ බවද,
- අදාළ විශ්‍රාම යාමේ යෝජනා ක්‍රමය තුලින් තමන්ට නිසි කාලය තුළ මූල්‍යමය ප්‍රදානයක් නොලැබුණ බවත් එම නිසා තමන් අදාළ යෝජනා ක්‍රමයට ඉදිරිපත් කරන ලද අයදුම්පත ඉල්ලා අස් කරගන්නා බවට 2017.01.15, 2017.04.08, 2017.07.28, 2017.08.11, 2017.09.20 හා 2017.09.23 යන දිනැති ලිපි මගින් ඉල්ලා සිටි බවද එහෙත් ඒවාට ආයතනය වෙතින් කිසිදු පිළිතුරක් තමන් වෙත නොලද බවද, පසුව ආයතනය විසින් තමාගේ සේවය 2017.10.06 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවසන් කරන ලද බවද,
- ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමය යටතේ තමන් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත නැවත ඉල්ලා අස්කර ගන්නා බව පාලනාධිකාරිය වෙත දැනුම් දුන්නද එය නොසලකා හැරිය බවද වෙනත් සේවකයන් දෙදෙනෙකු සම්බන්ධයෙන් පමණක් ඔවුන්ගේ ඉල්ලා අස්වීම භාරගෙන කටයුතු කර තිබෙන බවද,
- එනිසා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය තමන් සම්බන්ධයෙන් ඉතා අසාධාරණ හා අයුක්ති සහගත මෙන්ම දෙයාකාරයකින් කටයුතු කර තිබෙන බවද,

ප්‍රකාශ කර ඇත.

**දෙවන පාර්ශවයේ කරුණු දැක්වීම**

- ඉල්ලුම්කරු මන්නාරම ඩිපෝවේ VIII B ශ්‍රේණියේ ලිපිකරුවෙකු වශයෙන් සේවය කරන ලද බව පිළිගන්නා බවද,

- අදාළ ස්වේච්ඡා විශ්‍රාම ගැනීමේ පටිපාටිය යටතේ කැමැත්තෙන් විශ්‍රාම ගත් අයෙකු සේ සලකා කටයුතු කර තිබෙන බවද,
- ඒ අනුව ඔහුට හිමි වන්දි මුදල ගණනය කර අදාළ චෙක්පත ඔහුවෙත භාරදීමට කටයුතු කළද එය භාර ගැනීම ඔහු විසින් ප්‍රතික්ෂේප කර තිබෙන බවද,
- තම ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීමේ ඉල්ලුම්පත්‍රය ඉල්ලා අස්කර ගැනීමට ඔහු ඉල්ලීම් කර තිබෙන බවද,
- ඉල්ලුම්කරුගේ පියාගේ සැත්කමක් සඳහා මුදල් අවශ්‍යතාවය මත එසේ විශ්‍රාම ගැනීමට අයදුම් කළද අවශ්‍ය කාල වකවානුව තුළ එම වන්දි මුදල නොලැබුණ බැවින් ඉන් ඉවත් වීමට තීරණ කර තිබෙන බවද,
- සිය කැමැත්තෙන් විශ්‍රාම යාමට ඉල්ලුම්කරන්නන් 2016.06.30 වන දින හෝ ඊට පෙර ඉල්ලුම් කළ යුතුව තිබූ බවද එසේ කළ විටකදී එම අයදුම් පත්‍රය නැවත ඉල්ලා අස්කර ගත නොහැකි බවද,
- ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමට බොහෝ සේවක සේවිකාවන් ඉල්ලීම් කර පසුව ඒවා ඉල්ලා අස්කර ගැනීමට ඉල්ලීම් කර තිබෙන බවද, එම නිසා එම ඉල්ලුම්කරුට පමණක් විශේෂයක් කළ නොහැකි බවද,
- ඉල්ලුම්කරුට වන්දි මුදල ගෙවීම ප්‍රමාද වූ බවද එසේ ප්‍රමාද වූයේ මහා භාණ්ඩාගාරය වෙතින් මුදල් ලැබෙන ආකාරය අනුව බවද, ඒ නිසා එය මණ්ඩලය විසින් හිතාමතා කරන ලද වරදක් නොවන බවද,
- ඉල්ලුම්කරු වන්දි මුදල භාර නොගැනීම ඔහුගේ වරදක් බවද,

ප්‍රකාශ කර ඇත.

පාර්ශවයන්ගේ කරුණු දැක්වීමෙන් ඉක්බිතිව මෙම නඩුව විභාගයට ගැනීමට තීරණය කරන ලද අතර එහිදී විසඳිය යුතු වූ ප්‍රශ්ණ පිළිබඳව අවධානය යොමු කළෙමි.

**විසඳිය යුතු ප්‍රශ්න**

- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයන් සඳහා සිය කැමැත්තෙන් විශ්‍රාම ගැන්වීමේ පරිපාටිය අදාළ කර ගනිමින් වර්ෂ 2016 දී වලංගු චක්‍රලේඛයක් ක්‍රියාත්මකව පැවතියේද ?
- එම චක්‍රලේඛගත සුදුසුකම් මත ඉල්ලුම්කරුට ඒ සඳහා අයදුම් කිරීමේ හැකියාව කෙබඳු වීද ?
- චක්‍රලේඛයට අනුකූලව ඉල්ලුම්කරු විසින් නිසි අයදුම්පතක් නිසි කාලය තුළ ඉදිරිපත් කරන ලද්දේ ද ?
- එම අයදුම්පත වලංගු අයදුම්පතක් ලෙස පාලනාධිකාරිය විසින් පිළිගනු ලැබුවේද? නැතහොත් ප්‍රතික්ෂේප කරන ලද්දේ ද ?
- අදාළ අයදුම්පත නැවත ඉල්ලා අස්කරගන්නා බවට ඉල්ලුම්කරු විසින් ලිඛිත ඉල්ලීම් සිදුකරන ලද්දේ ද ?
- එසේ කිරීම සඳහා ඉල්ලුම්කරුට සාධාරණ වූ හේතු සාධක පැවතියේද ?
- එවැනි ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීමට පාලනාධිකාරියට සාධාරණ වූ හේතු සාධක වීද ?
- ඒ අනුව පළමු පාර්ශවය සඳහා කිසියම් සහන සැලසීමක් ප්‍රදානය කළ යුතු වන්නේ ද ?

ඉහත දැක්වෙන ප්‍රශ්නයන්ට විසඳුම් ලබාදීමේ අරමුණ පෙරදැරි කරගෙන මෙම නඩුව විභාගයට ගන්නා ලද අතර එහිදී තවදුරටත් ඒ ඒ පාර්ශවයන්ගේම යහපත සලකා කිසියම් හෝ සමථයක් පවතින්නේද ද යන්න විමසා සිටි අතර එවැනි සමථයක් තුලින් දෙපාර්ශවයටම හිමිවන්නා වූ සහනදායී තත්ත්වයන් ද පැහැදිලි කර දෙන ලදී. ඒ අනුව පළමු පාර්ශවය විසින් සමථයක් වශයෙන් කරුණු ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර සිටියේ ඉල්ලුම්කරුගේ සේවය අහිමිව සිටි කාලය සඳහා අඩ වැටුප් සහිතව නැවත සේවය ලබා දෙන ලෙසය. මෙම යෝජනාව සම්බන්ධයෙන් දෙවන පාර්ශවයේ ස්ථාවරය වූයේ 2016 අංක 01 දරන චක්‍රලේඛයේ 09 වගන්තිය අනුව ස්වේච්ඡා විශ්‍රාමයාමට අයදුම්කරන්නන් වර්ෂ 2016.06.30 දිනට පෙර ඉල්ලුම්කළ යුතු බවත් එසේ ඉල්ලුම්කළ පසු නැවත එය ඉල්ලා අස්කර ගත නොහැකි බවත්ය. කෙසේ වෙතත් මෙම අවස්ථාවේ දෙවන පාර්ශවයට ඒ පිළිබඳව තීරණයක් ලබාදිය නොහැකි බවත් පැහැදිලි විය. එම නිසා පළමු පාර්ශවයේ සමථ යෝජනාව ලිඛිතවම දෙවන පාර්ශවය වෙත ලබාදීමටත් එය ගමනාගමන මණ්ඩලයේ සභාපතිවරයා වෙත යොමුකර ඊට පිළිතුරක් ලබාගෙන කාර්මික අධිකරණය වෙත ඉදිරිපත් කරන ලෙසත් පාර්ශවයන් දැනුවත් කළෙමි.

තවද පාර්ශවයන් කිසියම් සමථයකට එළඹීමේදී එය වඩාත් පහසු කරවාලීම සඳහා පහත සඳහන් කරුණු කෙරෙහි ද අවධානය යොමු කළ යුතුව තිබේ.

එනම්,

I. 2016 අංක 01 දරන ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීමේ චක්‍රලේඛයේ පළමු ඡේදය අනුව අයදුම්පතක් ඉදිරිපත් කළයුතු අවසාන දිනය වන්නේ 2016.06.30 වන දින දී ය. එහෙත් පළමු පාර්ශවය සිය ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කර ඇත්තේ 2016.09.28 වැනි දින දී බැවින් එය චක්‍ර ලේඛයට පටහැණි වීම.

II. අදාළ ඉල්ලුම්පත්‍රය පිළිගත් බව හෝ ප්‍රතික්ෂේප කළ බව දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවය වෙත ලිඛිතව හෝ වාචිකව හෝ දැනුවත් කර නොමැති වීම.

III. පළමු පාර්ශවය විසින් අවස්ථා කීපයකදීම සිය ඉල්ලුම්පත්‍රය ඉල්ලා අස්කර ගන්නා බවට ලිඛිතවම ඉල්ලීම් කර තිබීම හා ඒවාට කිසිදු පිළිතුරක් දෙවන පාර්ශවය විසින් ඉදිරිපත් නොකර නොසලකා හැර තිබීම.

IV. පළමු පාර්ශවය විසින් ස්වේච්ඡා විශ්‍රාම ගැනීමකට පෙළඹීමට වූ හේතුව ඔහුගේ මානසික හෝ ශාරීරික හෝ දුර්වලතාවයක් හේතුකර ගෙන නොවීම.

V. තම පියාගේ හෘද සැත්කම සඳහා අවශ්‍ය මූල්‍යමය දායකත්වය එමඟින් පළමු පාර්ශවය අපේක්ෂා කළද එය නිසි කලට නියමිත පරිදි ලබාදීමට දෙවන පාර්ශවය අසමත් වී තිබීම.

VI. අදාළ වන්දි මුදල ලබාදෙන අවස්ථාව වන විට සිය පියා මියගොස් සිටීම නිසා පළමු පාර්ශවයේ මූලික අරමුණ ව්‍යර්ත වී තිබීම.

VII. ඉහත චක්‍රලේඛය පරිදි ස්වේච්ඡාවෙන් විශ්‍රාම ඉල්ලා පසුව ඒවා නැවත ඉවත් කර ගැනීමට වෙනත් සේවකයන් සඳහා අවසර දී තිබෙන බවට පළමු පාර්ශවය විසින් නම් සහිත විස්තර ඉදිරිපත් කර තිබීම.

VIII. දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවයේ සේවය අවසන් කර ඇත්තේ වර්ෂ 2017 ක් වූ ඔක්තෝබර් මස 06 වන දින සිට වුවත් ඊට මාස කීපයකට පෙර පළමු පාර්ශවය විසින් සිය අයදුම්පත ඉල්ලා අස්කර ගන්නා බවට ලිඛිතවම කරුණු දක්වා තිබියදී ඊට පසුව දෙවන පාර්ශවය විසින් තීරණය ක්‍රියාත්මක කර තිබීම.

### ප්‍රදානය

මේ අනුව පළමු පාර්ශවය විසින් තම සමථ යෝජනාව ලිඛිතව වර්ෂ 2022 ක් වූ අප්‍රේල් මස 06 වන දින දෙවන පාර්ශවය වෙත ඉදිරිපත් කර තිබෙන අතර එයට පිළිතුරු වශයෙන් එදිනට පසු දිනම එනම් වර්ෂ 2022 ක් වූ අප්‍රේල් මස 07 වන දිනැති ලිපියක් මගින් ඉල්ලුම්කරු පසු වැටුප් රහිතව නැවත සේවයේ යෙදවීමට එකඟ බවට දන්වා තිබේ. එහෙත් පළමු පාර්ශවයේ මුල් සමථ යෝජනාව එනම් අඩ වැටුප් සහිතව නැවත සේවයේ පිහිටුවීම යන්නට පසු වැටුප් රහිතව නැවත සේවයේ පිහිටුවීමට දෙවන පාර්ශවය වෙනත් සමථ යෝජනාවක් ඉදිරිපත් කර තිබෙන බැවින් ඒ සඳහා පළමු පාර්ශවයේ ප්‍රතිචාරය කිසියම් එකඟතාවයක් සඳහා හෝ නඩුව විභාග කිරීම ආරම්භ කිරීම සඳහා හෝ ඉතා වැදගත් වූ බැවින් ඒ පිළිබඳව පළමු පාර්ශවය වෙතින් කරුණු විමසා සිටිනු ලැබීය. දෙවන පාර්ශවයේ සමථ යෝජනාවට පළමු පාර්ශවයේ එකඟතාවය හිමි වූ බැවින් ඊට අනුරූපව කටයුතු කිරීමට පාර්ශවයන් ගිවිස ගන්නා ලදී.

එම නිසා ඉල්ලුම්කරු වහාම නැවත සෙවයේ පිහිටුවන ලෙසත් කිසියම් සේවකයෙකු නැවත සේවයේ පිහිටුවීමේදී පහත සඳහන් ආකාරයෙන් කටයුතු කිරීමට පාලනාධිකාරිය බැඳී සිටින බවටත් මින් නියෝග කරමි.

එනම්,

I. පෙර සිටි තනතුරෙහිම,

II. පෙර සේවය කළ සේවා ස්ථානයෙහිම,

III. සේවය කඩවීමකින් තොරව,

IV. තනතුරට හිමි වර්තමාන වැටුප් පරිමාණයේ සුදුසු වූ වැටුප් පියවරෙහි,

රඳවමින් සේවයේ පිහිට විය යුතු බවට ද නියෝග කරමි. තවද ඉහත එකඟතාවය මත පිහිටමින් ඔහු සේවයේ නිරතව නොසිටි කාලය තුළ වැටුප් උපයා ගැනීමක් නොකළ බැවින් එකී කාලය සඳහා වැටුප් රහිත ලෙස කටයුතු කළ යුතුය.

මෙම ප්‍රදානය යුක්ති සහගත සහ සාධාරණ වූ එකක් බවට මින් සහතික කරමි.

**ලොරා සුමතිපාල,**
බේරුම්කරු.

EOG 08-0191